" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 0112 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 0112 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 0112 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/01-2019
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2019-05- 09

ආණ්ඩුකාර ලේකම්(බ.ප),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප.),
සභා ලේකම්(බ.ප),
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්(බ.ප),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන අභ්‍යන්තර විගණක (අභ්‍යන්තර විගණන ඒකකය),
පරිපාලන නිලධාරි(පාලන),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්,

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 32/91(IV), 04/2018(I), 08/2019 හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක 01/2019 බස්නාහිර පළාතට අදාල කර ගැනීම.</u>**

රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/02/19/01/2019 හා 2019.05.03 දිනැති ලිපිය මඟින් මා වෙත දන්වා ඇත. (එම චක්‍රලේඛ පිටපත් මේ සමඟ අමුණා ඇත.)

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | කාරණය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 32/91(IV), 2019-03-13 | පළාත් පාලන ආයතනවලට ඡන්දයෙන් තේරී පත්වූ දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන් |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2018(I), 2019-03-14 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් හට වරලත් වෘත්තීය දීමනාව ලබා දීම |
| 03. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 08/2019, 2019-03-28 | ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 36 වගන්තිය සංශෝධනය කිරීම |
| 04. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක 01/2019, 2019-03-19 | අසාධු ලේඛනගත කරන ලද නිලධරයන් නැවත සේවයේ පිහිටුවීම |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙසත් ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

කේ.එන්. සූරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් (බ.ප.) වෙනුවට.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 04/2018(I)

මගේ අංකය : MPA/ASD/03/UNION 10
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2019.03.14

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් හට වරලත් වෘත්තීය දීමනාව ලබා දීම</u>**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ වරලත් ඉංජිනේරුවරුන් සඳහා, 2018.02.01 දින සිට මාසික දීමනාවක් ගෙවීමට නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2018 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ වරලත් වාස්තු විද්‍යාඥයින් සඳහා ද, එම චක්‍රලේඛය ක්‍රියාත්මක වූ දින සිට, එහි විධිවිධාන ප්‍රකාරව, වරලත් දීමනාව ගෙවීම සඳහා 2018.06.05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇති බව, අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/18/0857/734/013 හා 2018.06.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් දැනුම් දී ඇත.

03. ඒ අනුව කටයුතු කිරීම මැනවි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය